**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 වන දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 විගණන මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මතය සඳහා පදනම

**විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.85,929,375 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 193 | අයවැය සමග අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,753,759 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,494,186 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 19,000 | 19,330 | 44,593 | 75,499 | 19,000 | 19,026 | 5,803 | 100,712 |
| කුලී | 604,000 | 43,200 | 41,400 | 3,550 | 788,000 | 58,200 | 56,700 | 1,750 |
| බලපත්‍ර ගාස්තු | 83,000 | 459,250 | 443,000 | 23,250 | 94,000 | 510,400 | 518,750 | 7,000 |
| | 706,000 | 521,780 | 528,993 | 102,299 | 901,000 | 587,626 | 581,253 | 109,462 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ආදායම රු.100,712 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.19,330 ක් සමඟ අයවිය යුතු බදු මුදල රු.120,042 ක් වුවද රැස් කළ ආදායම රු.44,593 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට හා අක්කර බදු අය කළයුතු පාර්ශව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයක් මඟින් ඉදිරියේ දී හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.295,500 ක් හා මුද්දර ගාස්තු රු.32,880,596 ක් විය. එහෙත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ වාර්තා අනුව සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.1,987,787 ක් හා රු.2,250 ක් විය. | ලැබිය යුතු ආදායම් සැසඳීම් මගින් තහවුරු කරගෙන කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතහැර දැමූ ව්‍යාපෘති**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| උපමානපාදක සංවර්ධන ප්‍රදාන යටතේ ආදාහානාගාරයක් ඉදිකිරීමට රු.3,300,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දී රු.40,000 ක් වැයකර භූමිය මැණුම් කිරීම සිදුකර තිබුණි. නමුත්, ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ඉහත මුදල ප්‍රමාණවත් නොවන බැවින් ඉදිකිරීම් සිදුකර නොතිබූ අතර, අදාල ඉඩම සභාව සතු නොවන බැවින් වැයකළ මුදල ඵලදායී වියදමක් නොව | ගැටළු නිරාකරණය කරගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේ දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව දන්වමි. |

(ආ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර තිබුණ ද, නිශ්චිත ඉලක්ක පිහිටුවා එම ඉලක්ක ලඟාකර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත්ව ඇගයිය හැකි ආකාරයෙන් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධනය සඳහා වන දීර්සකාලීන සැලසුම් සකස් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

**3.2** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| පුරප්පාඩු තනතුරු 09 ක් සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත 02 ක් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |